**ජාතික ගමනාගමන කොමිෂන් සභාව - 2017**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා ගමනාගමන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 37 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට, ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

ප්‍රමිතයේ 31 ඡේදය ප්‍රකාරව ප්‍රමිතයෙන් ඉඩ දී ඇති ශුද්ධ පදනම මත වාර්තාකරණ මුදල් ප්‍රවාහයක් හැර ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරීත්වයන්ගෙන් වන දළ මුදල් ලැබීම්වල හා දළ මුදල් ගෙවීම්වල ප්‍රධාන පන්තීන් වෙනම වාර්තා කළ යුතු වුවත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස භාණ්ඩාගාරයෙන් ලද රු.4,589,099 ක් හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ රු.300,000,000 ක් වෙන් වශයෙන් නොදක්වා ශුද්ධ ප්‍රතිඵලය වූ රු.295,410,901 පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීමට අදාලව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණද, ප්‍රදාන ලෙස ලැබෙන ඉඩම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් අදාල ප්‍රතිපත්තියට ඇතුළත් කර නොතිබුණි. 2012 වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිලදී ගත් රු.134,279,913 ක් වටිනා ඉඩම් එම වර්ෂයේදී වත්කම් ලෙස හා එම ප්‍රමාණයට ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත්, ඊට පටහැනි ලෙස ඉඩම සඳහා සියයට 5 ක ක්ෂය ගණනය කොට රු.6,713,995 ක් පමණක් රජයේ ප්‍රදාන ගිණුම හර කර ආදායම් ප්‍රකාශයට බැර කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිතෝෂික ගණනය කිරීමේදී සම්පූර්ණ කරන ලද වර්ෂ ගණන පමණක් පදනම් කරගෙන ගණනය කළයුතු වුවත් පාරිතෝෂික වෙන් කිරීම ගණනය කිරීමේදි සම්පූර්ණ වර්ෂ ගණන සහ මාස ගණනද පදනම් කරගෙන තිබීම නිසා, නිලධාරීන් 69 ක් වෙනුවෙන් රු.754,642 ක් වැඩියෙන් පාරිතෝෂික වෙන්කිරීම් සිදු කර තිබුණි. ඒ අනුව එම ප්‍රමාණයෙන් පාරිතෝෂික වෙන් කිරීම් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සිසු සැරිය, නිසි සැරිය හා ගැමි සැරිය ව්‍යාපෘති සඳහා උපචිත වියදම් වෙනුවෙන් ඉකුත් වර්ෂයේ වෙන් කිරීම් සිදු නොකිරීම හේතුවෙන් ඉකුත් වර්ෂයට අදාලව ගෙවා තිබුණු රු. 38,299,494 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හා සමාලෝචිත වර්ෂයට අදාල උපචිත වියදම් සඳහා රු.7,429,132 ක් අඩුවෙන් වෙන් කිරීම සිදු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 30,870,362ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ආයතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය කරන ලද රු. 5,903,071 ක මුදල ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව, ව්‍යාපෘති වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට හර කර තිබීම හේතුවෙන් වත්කම් හා මෙහෙයුම් ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රති මිලදී ගැනුම් ආයෝජනවල (REPO) ආයෝජනය කර තිබූ රු.434,845,956ක් සඳහා සමාලෝචිත වර්ෂයට ලැබිය යුතු පොළිය රු.1,780,942ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වර්ෂය තුළ මිලදී ගන්නා ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ ද්‍රව්‍ය තොග ගිණුමේ පැවති ආරම්භක ශේෂය හා ඉතිරි තොගය සමඟ ගැලපුම්කර වර්ෂය තුළදී භාවිතා කළ ප්‍රමාණය පමණක් වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට, වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු රු. 5,276,646 ක ලිපි ද්‍රව්‍ය හා මුද්‍රණ තොග වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, වර්ෂය අවසානයේදී පැවති තොගය ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට පොත් 40 බැගින් වූ තාවකාලික මගී සේවා අවසර පත්‍ර පොත් කට්ටල 21 ක්ද, තථ්‍ය මගී සේවා අවසර පත්‍ර පොත් 100 බැගින් වූ කට්ටල 24 ක් , හා ඒකක 1000 බැගින් වූ විශේෂ චාරිකා අවසර පත්‍ර කට්ටල 14 ක් පැවතියද ඒවා ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) පනතේ 10 (5) වගන්තිය | කොමිෂන් සභාවේ සෑම වර්ෂයක් අවසානයේදීම ඇති වන ශුද්ධ අතිරික්ත ආදායමෙන් ඉතිරි සියළුම මුදල් ඒකාබද්ධ අරමුදල වෙත බැර කළ යුතු වූවද, 2014 වර්ෂය සිට 2016 වර්ෂය දක්වා සභාවේ රු.මිලියන109 සිට රු. මිලියන 190 දක්වා අතිරික්තයක් ඇති වී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය. | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත රු. 534,156,919 ක් ආයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 756 | කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) 1978 දෙසැම්බර් 18 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය පරිදි පරිගණක හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවද, සභාවේ රු. 51,965,073 ක් වටිනා පරිගණක හා මෘදුකාංග වෙනුවෙන් එසේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.160,889,609 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.190,189,747 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,300,138 ක පිරිහීමක් සිදු වී තිබුණි.සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ආදායම රු. 70,545,726 කින් වැඩිවී තිබුණද විශේෂ ව්‍යාපෘති සඳහා දරන ලද වියදම රු.84,366,969 කින් වැඩිවීම, ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේ දී මූල්‍ය ඌනතාවයක් පැවතියද, 2012,2014,2015 හා 2016 යන වර්ෂවල අතිරික්තයක් පැවතුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු. 109,057,130 ක් වූ සභාවේ දායකත්වය 2013 වර්ෂයේදී රු.80,262,665 ක සෘණ අගයක් බවට පත් වුවද, නැවත 2017 වර්ෂයේදී රු. 307,494,715 දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 කොමිෂන් සභාවට එරෙහිව හෝ කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බලපත්‍ර හා ටෙන්ඩර් උසස් වීම් මාර්ග දීර්ඝ කිරීම් ආදී කරුණු වලට අදාලව බාහිර පාර්ශවයන් 22 ක් විසින් කොමිෂන් සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 22 ක් පවරා තිබුණි.

(ii) එමෙන්ම අභියාචනාධිකරණයේ බලපත්‍ර සම්බන්ධයෙන් නඩු 03 ක්ද, බැස්ටියන් මාවතේ ආසන වෙන් කිරීම සම්බන්ධයෙන් නඩු 01ක්ද, කොළඹ බදුල්ල මාර්ගයේ කාලසටහන් නිකුත් කිරීම සම්බන්ධයෙන් නඩු 01ක් ද,වශයෙන් නඩු 05ක්, සභාවට එරෙහිව විභාග වෙමින් පැවතුණි.

(iii) ගමනාගමන කොමිෂන් සභාව විසින් නිකුත් කරන වලංගු මගී සේවා අවසර පත්‍රයක් නොමැතිව බස්රථ ධාවනය කිරීම වෙනුවෙන් අදාළ පාර්ශවයන් වෙත කොමිෂන් සභාව විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩු 16ක් විභාග වෙමින් පැවතුණි.

(iv) සභාවට එරෙහිව බස්රථ ආසනවල ප්‍රමිතිය සම්බන්ධයෙන් එක් නඩුවක්ද, බලපත්‍ර සම්බන්ධයෙන් නඩු 02ක් ද දිස්ත්‍රික් උසාවියේ විභාග වෙමින් පැවතුණි.

(v) සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවට එරෙහිව කම්කරු විනිශ්චයාධිකරණයේ පවරන ලද නඩු 03ක් ද විභාග වෙමින් පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් කරන ලද පහත සඳහන් ඉලක්කයන් සම්පූර්ණ කර ගත නොහැකි වී තිබුණි.

(අ) ගැමි සැරිය සේවාවන් 3ක් පැවති අතර, එය සේවාවන් 28 කින් වැඩි කිරීමට ඉලක්ක ගත කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී සේවාවන් 6ක් දක්වා පමණක් වැඩි කරගෙන තිබුණ අතර, සේවාවන් 25 ක් වැඩි කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) නිසි සැරිය ව්‍යාපෘතිය යටතේ සේවාවන් 123 සිට 158 දක්වා වැඩිකර ගැනීමට සැලසුම් කර තිබුණද, 130 දක්වා පමණක් වැඩිකරගෙන තිබුණු අතර, නව සේවා 28ක් සැලසුම් කළ පරිදි වැඩිකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) කිලිනොච්චි බස් පර්යන්තයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දින වන විට සියයට 50ක ප්‍රතිශතයක් පමණක් නිමකර තිබුණි.

(ඈ) යාපනය බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා රු. මිලියන 150 ක මුදලක් වෙන්කර තිබුණු අතර එම ඉදිකිරීම් කටයුතුවලින් සියයට 40 ක් සමාලෝචිත වර්ෂය තුළ සිදුකිරීමට ඉලක්ක කර තිබුණද, වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඉ) ජාතික ගමනාගමන කොමිෂන් සභා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු 2017 වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කිරීමට සැලසුම්කර තිබුණ ද, එහි සැලසුම් අදියර පමණක් සමාලෝචිත වර්ෂය තුළ නිමකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව හිඟුරක්ගොඩ බස් පර්යන්තයේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණද, වර්ෂය තුළදී සියයට 30ක් පමණක් නිමකර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2018 ජූලි 12 විගණිත දින වන විටත් අවසන් කර නොතිබුණි.

(උ) කොමිෂන් සභාවේ සිට බස්රථ හා මගීන්ගේ තොරතුරු නිරීක්ෂණය කිරීම සඳහා ජී.පී.එස් පරිගණක මෘදුකාංග පහසුකම් පද්ධතියක් ගොඩනැගීමට ක්‍රියාකර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී මේ සඳහා රු. 17,570,635 ක පරිගණක මිලදී ගෙන තිබුණි. ජී.පී.එස් (Global Position System) පරිගණක මෘදුකාංග පහසුකම් පද්ධතිය යටතේ බස්රථ 3271 කට අදාළ උපකරණ සවිකළ යුතු වුවද, සවිකර තිබුණේ බස්රථ 767 කට පමණි. මින් සිම් කාඩ් නිකුත් කර තිබුණේ බස් රථ 697 කට පමණි. මේ අනුව බස් රථ ඇණියෙන් සියයට 79ක ප්‍රතිශතයක් ජී.පී.එස් තාක්ෂණය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභා පනතේ මගී සේවා අවසර පත් සඳහා ගාස්තු අයකරන ආකාරය දක්වා නොතිබුණු අතර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රු. 3,000 ක වාර්ෂික ගාස්තුවක් යටතේ එම බලපත්‍ර ලබාදීම සිදුකර තිබුණි. මෙම බලපත්‍ර ඥාතිත්වය මත පමණක් වෙනත් කෙනෙකුට පැවරීමේ දී, වාර්ෂිකව රු. 15,000 ක ගාස්තුවක් යටතේ 2010 වර්ෂය සිට අලුතින් ලබාදෙන බලපත්‍ර ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර තෝරා ගත් පුද්ලයන්ට ලබාදී තිබුණද ඒ අනුව පනත සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් එකම මාර්ගය වෙනුවෙන් ගාස්තු වර්ග 03ක් යටතේ බලපත්‍ර ලබාදීම සිදුවී තිබුණි. කොමිෂන් සභාවේ 2018 ජූලි 5 දිනට ලබා දී තිබුණු මුළු බලපත්‍ර 3171 න් සියයට 62 ක්ම රු. 3,000 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් යටතේ ලබා දී තිබුණු අතර, මුළු බලපත්‍රවලින් සියයට 29 ක් රු. 15,000 ක වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුවක් මත ලබා දී තිබුණි. ඒ අනුව මුළු බලපත්‍ර වලින් සියයට 91ක් ටෙන්ඩර් කිරීමෙන් තොරව ලබා දී තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවට ලැබිය හැකිව තිබුණු විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සාමාන්‍ය හා අධිවේගී මාර්ග සඳහා සමීක්ෂණ සිදු කිරීම මගින් නව මාර්ග හඳුනාගෙන, නව මගී සේවා අවසරපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 25 (ආ) වගන්තිය අනුව එක් වසරකට නොඅඩු වූ ද වසර තුනකට නොවැඩි වූ ද, කාල පරිච්ඡේදයක් සඳහා බලාත්මක වන සේ, මගී සේවා අවසර පත් නිකුත් කළ යුතු වුවත්, ඊට පටහැනි වන සේ, සමාලෝචිත වර්ෂය තුළ පහත පරිදි තාවකාලික බලපත්‍ර නිකුත් කර තිබුණි.

(i) සාමාන්‍ය මාර්ග සඳහා දිනකට රු.200ක ගාස්තු අයකිරීමේ පදනම මත හා ප්‍රධාන කාර්යාලය හා බැස්ටියන් මාවත කාර්යාලය මගින්, තාවකාලික බලපත්‍ර 5819 ක් ලබාදී තිබුණු අතර දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් දිනකට රු.1500 හා රු.1000 බැගින් අයකර, පිළිවෙලින් 2274 ක් හා 2050ක් වශයෙන්, එකතුව 4324 ක් තාවකාලික බලපත්‍ර නිකුත්කර තිබුණි. තවද අධිවේගී මාර්ගයේ 2015 ජූලි 25 දින සිට 2017 ජූනි 30 දක්වා කාලපරිච්ඡේදය තුළ සුඛෝපභෝගී බස් රථ 65 ක් සඳහා දිනකට රු.2,500ක් බැගින් අයකර තාවකාලික මගී සේවා අවසර පත්‍ර නිකුත් කර තිබුණි. 2017 ජූලි 01 දින සිට ඉහත බස් රථ 65 න් බස් රථ 48 ක් සඳහා ආයතනය විසින් ගණනය කළ දිනක අවම තාක්ෂණික අගය පදනම් කරගෙන බලපත්‍ර නිකුත් කර තිබුණි. මේ අනුව ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කර තරඟකාරී මිල ගණන් ලබාගෙන බලපත්‍ර ලබාදීම සඳහා පුද්ගලන් තෝරා නොගැනීම නිසා ආයතනයට ලබා ගත හැකිව තිබුණු ආදායම අඩු වී තිබුණි.

(ii) කොමිෂන් සභාවේ වගකිවයුතු නිලධාරියෙකු නොවන වේලා සටහන්කරු වෙත තාවකාලික බලපත්‍ර නිකුත් කිරීමට අවසර ලබා දී තිබුණි. ඒ අනුව මහරගම , කඩුවෙල හා කඩවත බස්නැවතුම්පොල වේලා සටහන්කරු විසින් දිනකට රු.1500 හා රු.1000 බැගින් අයකර පිළිවෙලින් 947ක් හා 25ක් වශයෙන් බලපත්‍ර 972ක් නිකුත්කර තිබුණි.

(ඇ) දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත 2017 සැප්තැම්බර් සිට 2018 මැයි මාසය දක්වා ලබා දී තිබුණු, තාවකාලික අවසර පත්‍ර පොත් 139ක, මුදල් හා කාර්යාල පිටපත සහිත වූ පොත්, විගණිත දින වූ 2018 ජූලි 19 දින වන විටත්, ආපසු කොමිෂන් සභාව වෙත භාර දී නොතිබුණි.

(ඉ) 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය පරිදි යම් තැනැත්තෙකු වෙත ප්‍රදානය කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් තැනැත්තෙකුට පැවරිය නොහැකි විය යුතු අතර, එවැනි පැවරීමක් ශූන්‍ය හා බල රහිත වේ. එසේ වුවද, රු. 5000 ක පැවරීමේ ගාස්තුවක් හා අළුත්කිරීමේ ගාස්තු ලෙස වාර්ෂිකව රු.15,000 බැගින් අයකිරීම මත 2016 හා 2017 වර්ෂවලදී බලපත්‍ර 63ක් ඥාතීත්වය මත අයිතිය වෙනස් වී තිබුණි.

(ඊ) අධිවේගී මාර්ගයේ පිටත වටරවුම මාර්ගය හරහා ප්‍රධාන නගරවලට බස් ධාවනය කිරීමේ හැකියාව පිළිබඳ සමීක්ෂණයක් කිරීමට මොරටුව විශ්වවිද්‍යාලය වෙත භාර දී තිබුණු අතර, කොමිෂන් සභාව ඒ සඳහා රු.2,127,465ක වියදමක් දරා තිබුණි. ඒ සඳහා මොරටුව විශ්වවිද්‍යාලය අතුරු වාර්තාවක් පමණක් 2015 අගෝස්තු 04 දින ඉදිරිපත් කර තිබුණු අතර, නව ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණි. එහෙත් විශ්වවිද්‍යාලය මගින් ඉදිරිපත් කරන ලද මිල ඇස්තමේන්තුව සමඟ සභාව එකඟ නොවූ අතර, සභාව විසින් එම කටයුතු ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි. එසේ වුවද, 2018 ජූලි 19 විගණිත දින වන විටද එම කටයුතු ආරම්භ කිරීමට කොමිෂන් සභාවට නොහැකිවී තිබුණි.

(උ) උතුරු පළාතේ ප්‍රධානම බස්රථ හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස, 2015 වර්ෂයේදී රු.166,393,051ක් වැය කර, වවුනියාව නගරයේ බස් පර්යන්තයක් ඉදිකර තිබුණි. එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර කොන්ත්‍රාත්කරු විසින් 2017 ජනවාරි 15 දින සභාව වෙත භාරදී තිබුණද, එදින සිට 2017 දෙසැම්බර් 31 දින වන විටත්, එම බස් පර්යන්තය භාවිතයට ගෙන නොතිබුණි. කෙසේ වුවද, එම කාලය තුළ එහි කාර්යමණ්ඩල වැටුප්, පිරිසිදු කිරීමේ වියදම්, විදුලිය, දුරකථන හා ජල බිල්පත් වෙනුවෙන්, රු. 2,807,541 ක වැයකර දරා තිබුණු අතර, බස් පර්යන්තය ප්‍රයෝජනයට ගැනීමට වගකිවයුතු පාර්ශ්වයන් කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම පිරිවැය නිෂ්කාර්ය වියදම් බව නිරීක්ෂණය විය.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී, තනතුරු 15 ක පුරප්පාඩු පැවති අතර, තනතුරු 03 ක අතිරික්තයක් විය.පුරප්පාඩු තනතුරුවලින් තනතුරු 05 ක් විධායක මට්ටමේ තනතුරු වන අතර 2018 ජූලි 16 දින වන විටත්, එම තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකර නොතිබුණු අතර වැඩබැලීමේ පදනම මත එම තනතුරුවල රාජකාරි ආවරණය කර තිබුණි. අධ්‍යක්ෂ මූල්‍ය හා ප්‍රසම්පාදන තනතුර පුරප්පාඩුව පැවතීම හේතුවෙන්, මූල්‍ය බලතල බෙදා හැරීම පිළිබඳව සහ ආයතනයේ ප්‍රසම්පාදන කටයුතු නිසියාකාරව සිදු කිරීමට බාධාවක් වී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් දැනුවත් වී තිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ දින 30 ක් ප්‍රමාද වී, එනම් 2018 මාර්තු 29 දිනදීය.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

#### 6.2.1 ප්‍රසම්පාදනය

---

ආයතන විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 ඡේදය ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

#### 6.2.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මැදිරිගිරිය බස් නැවතුම්පල ඉදිකිරීමේ කටයුතු 2016 ඔක්තෝම්බර් 11 වෙනි දින ආරම්භ කළ අතර, එහි ගිවිසුම්ගත ව්‍යාපෘති පිරිවැය රු. 68,197,933 ක් විය. ගිවිසුම් අනුව කාලය දීර්ඝ කිරීමෙන්ද, පසුව මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු 06 දින නිම කළ යුතු වුවත්, ව්‍යාපෘතියේ වැඩ අවසන් කර කොමිෂන් සභාව වෙත බාර දෙන ලද්දේ 2018 මාර්තු 28 දින වන අතර, මෙම බස් පර්යන්තය මහජන අයිතියට පවරා ඇත්තේ තවත් මාස 04 ක කාලයකට පසුව බව නිරීක්ෂණය විය.

(ආ) කින්නියා අදියර ii ව්‍යාපෘතියෙහි ගිවිසුම් අනුව, ව්‍යාපෘති පිරිවැය රු. 7,137,740.50 ක් වන අතර, මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 ජනවාරි 18 දින ආරම්භ කර තිබුණි. මෙහි ඉදිකිරීම් කටයුතු ගිවිසුම් ප්‍රකාරව 2017 මාර්තු 18 දින නිම කළ යුතු වුවත්, ඉදිකිරීම් නිමකර තිබුනේ 2017 අගෝස්තු 17 දිනදීය. මෙම බස් පර්යන්තය ජනතාව වෙත විවෘත කරන ලද්දේ 2018 අගෝස්තු 22 දිනදී ය. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිමවීමෙන් පසුවත්, වසරක කාලයක් ප්‍රමාද වී ජනතාව වෙත මෙම බස් නැවතුම්පොල විවෘත කර නොතිබුණි. මෙලෙස ව්‍යාපෘති කටයුතු දීර්ඝ කාලයක් ප්‍රමාද වීම කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

### 6.3 අයවැය ලේඛනමය පාලනය

---

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් ශේෂ සැසඳීමේදී, ආදායම් හා වියදම් ශීර්ෂ 15 ක, සියයට 10 සිට සියයට 160 දක්වා වූ, විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව, විගණනයේදී නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු, වරින් වර කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) මෙහෙයුම් පාලනය | (i) ලංසු කැඳවීම් තුළින් මගී සේවා බලපත්‍ර නිකුත් නොකිරීම<br>(ii) බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද වීම.<br>(iii) බලපත්‍ර පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඇතුළත් ලේඛන නඩත්තු නොකිරීම.<br>(iv) තාවකාලික මගී සේවා බලපත්‍ර නිකුත් කිරීම.<br>(v) වව්චර් සඳහා ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි අනුව කටයුතු නොකිරීම.<br>(vi) සෑම ගෙවීමක්ම වව්චරයේ සඳහන් මුදල ලද බවට තහවුරු නොවීම |
| (ආ) ප්‍රසම්පාදන කටයුතු | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකිරීම හා ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීමකින් තොරව ප්‍රසම්පාදනයන් සිදුකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) මූල්‍ය පාලනය | භාණ්ඩාගාරයෙන් ලබාගත් මුදල් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය නොකිරීම. |
| (ඉ) වාහන පාලනය | (i) සෑම මාස 6 කට වරක්ම ඉන්ධන පරිභරණය පරීක්ෂා නොකිරීම<br>(ii) දෛනික ධාවන සටහන්වල ඉන්ධන තුලනයන් සිදු නොකිරීම<br>(iii) දෛනික ධාවන සටහන් නියමිත කාලයට අනුව පිළියෙල නොකිරීම<br>(iv) විස්තර ඇතුළත් වාහන පිළිබඳ ලේඛණයක් භාවිතා නොකිරීම |